සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**33 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

ඉතිහාසය I
வரலாறு I
History I

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

උපදෙස්:
- ※ **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
- ※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- ※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** මහාවංස ටීකාව ලෙස හඳුන්වන කෘතිය කුමක් ද?
(1) දීපවංසය (2) වංසත්ථප්පකාසිනී (3) නිකාය සංග්‍රහය (4) රාජාවලිය

**2.** ශ්‍රී ලංකාවෙන් හමුවූ පැරණිතම කාසි කිනම් නමකින් හැඳින්වේ ද?
(1) කහාපණ (2) ස්වස්තික කාසි (3) ලක්ෂ්මී කාසි (4) තඹ මස්ස

● පහත A, B, C හා D ප්‍රකාශ ඇසුරෙන් **03** සහ **04** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A – පිළිස්සූ මැටි වළං භාවිත කිරීම
B – යකඩ ලෝහය භාවිත කිරීම
C – සංචාරක ජීවිතයක් ගත කිරීම
D – දෛනික කාර්යන් සඳහා ක්ෂුද්‍ර ගල් මෙවලම් භාවිතය

**3.** ප්‍රාග් ඓතිහාසික යුගය හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,
(1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ C ය. (4) C සහ D ය.

**4.** පූර්ව ඓතිහාසික යුගය හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,
(1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ C ය. (4) C සහ D ය.

**5.** පුරාණ ගම්වල ප්‍රධානියා හැඳින්වූ නම කුමක් ද?
(1) ගහපති (2) ගමික (3) පරුමක (4) මපුරුමුකා

**6.** අනුරාධපුරය නගරයක් ලෙස වර්ධනය වීමට බලපෑ ප්‍රධාන සාධකය වූයේ,
(1) අන්තර්ජාතික වෙළෙඳාම ය. (2) දිවයින වටා යා හැකි මාර්ග පද්ධතියක් පැවතීම ය.
(3) කෘෂිකර්මාන්තයට හිතකර වීම ය. (4) රාජ්‍ය පාලනයට පහසුවීම ය.

**7.** ශ්‍රී ලාංකික රජවරුන් කිහිපදෙනකුගේ නම් **I තීරුවේ** ද, ඔවුන් හා සම්බන්ධ ඓතිහාසික සිදුවීම් **II තීරුවේ** ද දැක්වේ. **I තීරුව** අනුව **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. පණ්ඩුකාභය | A – මිරිසවැටි දාගැබ ඉදිකිරීම |
| 2. දේවානම්පියතිස්ස | B – අනුරාධපුරය අගනගරය බවට පත් කිරීම |
| 3. වළගම්බා | C – ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම |
| | D – ශ්‍රී මහා බෝධිය රෝපණය කිරීම |

(1) A B C (2) B D C (3) C B A (4) D A B

**8.** සෘෂිගිරි ඇමති විසින් පාලනය කළ ප්‍රදේශය කුමක් ද?
(1) රෝහණ දේශය (2) වන්නි ප්‍රදේශය (3) දක්ඛිණ දේශය (4) නාගදීපය

[දෙවැනි පිටුව බලන්න.

9. මලය රට හෙවත් මධ්‍ය කඳුකරය රජරට අවධියේදී වඩාත් ප්‍රසිද්ධියට පත් වීමට මුල් වූ හේතුව කුමක් ද?
(1) සුවදායක දේශගුණයක් පැවතීම
(2) ප්‍රධාන ගංගාවල පෝෂක ප්‍රදේශය වීම
(3) ආක්‍රමණ හා අභ්‍යන්තර අරගල අවස්ථාවලදී පාලකයින්ට ආරක්ෂක ස්ථානයක් වීම
(4) විදේශ වෙළෙඳාම සඳහා වෙළෙඳ ද්‍රව්‍ය සැපයූ ප්‍රදේශයක් වීම

10. ප්‍රථමවරට දිවයිනේ ග්‍රාම සීමා නියම කරවන ලද රජතුමා කවුරුන් ද?
(1) පණ්ඩුකාභය (2) දේවානම්පියතිස්ස (3) කාවන්තිස්ස (4) වසභ

● පහත ප්‍රකාශ ඇසුරෙන් අංක 11 සිට අංක 12 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – සකපෝරුව භාවිතයෙන් මැටි වළං තැනීම
B – අකුණුවලින් ආරක්ෂා වීමට අකුණු සන්නායක භාවිතය
C – සීගිරි උද්‍යානය නිර්මාණය කිරීම
D – ලම්බාකාරව බිත්ති බැඳීම

11. පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) B සහ D

12. අනුරාධපුර යුගයේ තාක්ෂණය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) B සහ D

13. අතීතයේ ශ්‍රී ලංකාවේ කාසිවල වටිනාකම තීරණය කිරීමට පදනම් වූ ප්‍රධාන සාධකය කුමක් ද?
(1) විශාලත්වය (2) ලෝහ බර (3) නිකුත් කළ වර්ෂය (4) නිකුත් කළ රට

14. ගෘහදණ්ඩ බද්ද යනු,
(1) වැව්වල ජලය භාවිත කරන්නන්ගෙන් අය කළ බද්දකි.
(2) රජුට අයත් ඉඩම් වගා කිරීම වෙනුවෙන් ගොවීන් විසින් රජයට ගෙවන ලද්දකි.
(3) ඇළ මාර්ගවල මසුන් ඇල්ලීම වෙනුවෙන් රජයට ගෙවිය යුතු බද්දකි.
(4) සැඟවී සිටි අපරාධකරුවන් අල්ලා ගන්නා තෙක් ඔවුන් ජීවත් වූ ගම්වල වැසියන්ගෙන් අය කරන ලද්දකි.

15. ශ්‍රී ලාංකික රජවරු කිහිපදෙනෙකුගේ නම් **I තීරුවේ** ද, ඔවුන්ගේ රාජධානි **II තීරුවේ** ද දැක්වේ. **I තීරුවේ** අනුපිළිවෙළට **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. පළමුවන විජයබාහු | A – අනුරාධපුරය |
| 2. දෙවන පරාක්‍රමබාහු | B – පොළොන්නරුව |
| 3. දුටුගැමුණු | C – දඹදෙණිය |
| | D – මහනුවර |

(1) A C B (2) A D B (3) B C A (4) B D C

16. පළමුවන විජයබාහු රජතුමාගේ සේවාව ඇගයීමේදී ප්‍රමුඛත්වය දිය යුතු වැදගත්ම කරුණ කුමක් ද?
(1) විවාහ සබඳතා මගින් අසල්වැසි රටවල් සමග සබඳතා ගොඩනගා ගැනීම
(2) පිරිහීමට පත්ව තිබූ වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම
(3) විදේශීය පාලනයෙන් මෙරට මුදවාගෙන රට එක්සත් කිරීම
(4) නටබුන්ව තිබූ වෙහෙර විහාර පිළිසකර කිරීම

17. ක්‍රිස්තු වර්ෂ 15 වන සියවස මැද දී ක්‍රිස්තියානි සහ මුස්ලිම් භක්තිකයන් සටන් කළේ කුමන නගරයේ අයිතිය ලබාගැනීම උදෙසා ද?
(1) ජෙරුසලම් (2) කොන්ස්තන්තිනෝපල්
(3) රෝමය (4) වැනිසිය

18. පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A – ආනයන අපනයන ආර්ථිකයක් බිහිවීම
B – මුදල් භාවිතය ප්‍රචලිත වීම

යුරෝපයේ ඇති වූ පුනරුදය ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කළ බලපෑම සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

[තුන්වැනි පිටුව බලන්න.

- A සිට D දක්වා ප්‍රකාශ ඇසුරෙන් **19** සහ **20** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A – ටිකිරි කුමරු විසින් මුල්ලේරියාවේදී පෘතුගීසීන් පැරදවීම
  B – පෘතුගීසීන් විසින් රැජිණ ලෙස කුසුමාසන දේවිය නම් කිරීම
  C – මායාදුන්නේ ආරම්භක පාලකයා වීම
  D – මහා අස්ථාන කුමරු විසින් රන්දෙණිවලදී පෘතුගීසීන් පැරදවීම

**19.** සීතාවක රාජධානිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

**20.** මහනුවර රාජධානිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

**21.** කෘෂිකර්මාන්තයේදී පේළියට වැපිරීමේ ක්‍රමය මගින් අත්වන වාසියක් වන්නේ,
(1) වගා භූමිවල හටගන්නා වල් පැලෑටි ප්‍රමාණය අඩු වීම ය.
(2) වගාවන්ට පොහොර යෙදීම පහසු වීම ය.
(3) වගාවට වැළඳෙන ලෙඩ රෝග ව්‍යාප්තිය අවම වීම ය.
(4) වැපිරීමට අවශ්‍ය බීජ ප්‍රමාණය අඩු කරගැනීමට හැකිවීම ය.

**22.** වර්ෂ 1818 නිදහස් සටන අසාර්ථක වීමට හේතු වූයේ,
(1) සත්කෝරළය හරහා උඩරටට හමුදා සහ අවි ආයුධ යැවීමට ඉංග්‍රීසීන්ට හැකිවීම ය.
(2) සාමාන්‍ය ජනතාවගේ සහයෝගය නොලැබීම ය.
(3) ගම්සභා ක්‍රමය අහෝසි කිරීම නිසා ජනතාව එක්රැස් කිරීම දුෂ්කර වීම ය.
(4) රජු ලෙස ඉදිරිපත් වූ තැනැත්තාට රාජ්‍ය උරුමයක් නොමැති බව හෙළිවීම ය.

**23.** පහත වගුවේ **I තීරුවෙන්** බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීමේදී වැදගත් වූ වර්ෂ ද **II තීරුවෙන්** එම වර්ෂවල වූ සිදුවීම් ද දැක්වේ. **I තීරුවට** අනුව **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. 1796 | A – මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටය යටතට ගැනීම |
| 2. 1802 | B – පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමේ පාලනය ආරම්භ වීම |
| 3. 1815 | C – ද්විත්ව පාලනය ආරම්භ වීම |
| | D – උඩරට රාජධානිය ඉංග්‍රීසීන් යටතට ගැනීම |

(1) A C B (2) B A D (3) C A B (4) D B C

**24.** වන්නාර්පන්නෙයි ශෛව ප්‍රකාශ විද්‍යාලය පිහිටුවීමට පුරෝගාමී වූයේ කවුරුන් ද?
(1) ආරුමුග නාවලර්තුමා (2) පොන්නම්බලම් රාමනාදන්
(3) පොන්නම්බලම් අරුණාචලම් (4) නටේෂ අයියර්

**25.** ශ්‍රී ලංකාවේ විවිධ ජනවර්ගයන්ට අයත් පුද්ගලයන් රටේ යහපත උදෙසා ජාති ආගම් භේදයකින් තොරව ක්‍රියාකර ඇති අයුරු වඩාත් හොඳින් පිළිබිඹු වන සංවිධානය කුමක් ද?
(1) යාපනේ සංගමය (2) පහතරට වැවිලිකරුවන්ගේ සංගමය
(3) ලංකා ජාතික සංගමය (4) හලාවත සංගමය

**26.** අනුරාධපුරයේ බෞද්ධ අයිතීන් රැකගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කළ පුද්ගලයා වූයේ,
(1) අනගාරික ධර්මපාලතුමා ය. (2) පියදාස සිරිසේන ය.
(3) වලිසිංහ හරිස්චන්ද්‍රතුමා ය. (4) හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා ය.

- බ්‍රිතාන්‍යයන් විසින් මෙරටට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. ඒවා ඇසුරෙන් **27** සහ **28** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

  A – අගමැතිවරයා
  B – විධායක කාරක සභා ක්‍රමය
  C – පාර්ලිමේන්තුව
  D – ව්‍යවස්ථාදායක සභාව
  E – පළාත්බද නියෝජනය

**27.** ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන් ලක්ෂණය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**28.** සෝල්බරි ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන් ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A සහ C (2) A සහ D (3) B සහ C (4) B සහ E

[හතරවැනි පිටුව බලන්න.

**29.** යුරෝපීයන් විසින් ලංකාවට හඳුන්වා දුන් නව වැවිලි බෝග වන්නේ,
(1) සිංකෝනා, කොකෝවා, තේ සහ රබර් ය. (2) කෝපි, කුරුඳු, තේ සහ රබර් ය.
(3) කෝපි, කොකෝවා, තේ සහ පොල් ය. (4) කෝපි, තේ, රබර් සහ පොල් ය.

**30.** ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණායතනය පිහිටුවා ඇත්තේ කොහේ ද?
(1) ලුණුවිල (2) අගලවත්ත (3) තලවකැලේ (4) මාතලේ

**31.** ශ්‍රී ලංකාව ප්‍රථමවරට ඒකීය ජනරජයක් බවට පත් වූයේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද?
(1) ඩොනමෝර් (2) සෝල්බරි (3) 1972 (4) 1978

**32.** රටේ ආර්ථික සංවර්ධනය සඳහා වැඩිම දායකත්වයක් ලබාදෙන ගංගාව කුමක් ද?
(1) මහවැලි (2) කැලණි (3) කළු (4) වලවේ

**33.** ජාතික වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් සෘජුවම මහජන මතය ලබාගන්නා ක්‍රමය කුමක් ද?
(1) පළාත් සභා මැතිවරණය (2) පාර්ලිමේන්තු මැතිවරණය
(3) ජනාධිපතිවරණය (4) ජනමත විචාරණය

**34.** පළමුවන ලෝක මහා සංග්‍රාමයේදී ජර්මනිය ඇතුළු මධ්‍යම බලවතුන්ගේ පිල පරාජය වීමට බලපෑ ප්‍රබලතම හේතුව වූයේ,
(1) ඇමෙරිකා එක්සත් ජනපදය මිත්‍ර පිලට එකතු වීම ය.
(2) මධ්‍යම බලවතුන්ගේ පිලේ සිටි ඉතාලිය මිත්‍ර පිලට එකතු වීම ය.
(3) බ්‍රිතාන්‍යයට ශක්තිමත් නාවුක බලයක් තිබීම ය.
(4) ජර්මන් නාවුක හමුදාව තම අධිරාජයාට විරුද්ධව කැරලි ගැසීම ය.

**35.** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සියලුම සාමාජික රටවල් නියෝජනය කරන ප්‍රධාන ආයතනය කුමක් ද?
(1) භාරකාර මණ්ඩලය (2) ජාත්‍යන්තර අධිකරණය
(3) මහා මණ්ඩලය (4) ආර්ථික හා සමාජීය මණ්ඩලය

**36.** පළමුවන ලෝක යුද්ධයෙන් පසු වර්සෙල්ස් ගිවිසුම මගින් දැඩි දඬුවම්වලට භාජනය කළ රට කුමක් ද?
(1) ප්‍රංශය (2) ඉතාලිය (3) ජර්මනිය (4) රුසියාව

**37.** පහත A, B, C යටතේ ඇති සංවිධාන ඒවා බිහි වූ කාලය අනුව ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ සහිත පිළිතුර කුමක් ද?
A – එක්සත් ජාතීන්ගේ සංවිධානය
B – නොබැඳි ජාතීන්ගේ සංවිධානය
C – ජාතීන්ගේ සංගමය
(1) A B C (2) B C A (3) C A B (4) C B A

● පහත A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර **38** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. රාජාණ්ඩු ක්‍රමය
2. ප්‍රංශ විප්ලවය

B – 1. රුසියානු විප්ලවය
2. සමාජවාදී දර්ශනය

C – 1. ස්ටේට්ස් ජෙනරල් සභාව
2. රුසියානු විප්ලවය

D – 1. ඇමෙරිකානු විප්ලවය
2. බොස්ටන් තේ සාදය

**38.** දෙවැන්නේ ජයග්‍රහණයත් සමග පළමුවැන්න බිඳ වැටුණ බව දැක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**39.** පළමුවැන්න හා දෙවැන්න අතර සබඳතාවක් **නොදැක්වෙන** ප්‍රකාශ යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**40.** පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න ව්‍යාප්ත වූ බව දැක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**33 S II**

283360

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

**ඉතිහාසය II**
வரலாறு II
History II

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය** - **මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* **I කොටසේ** ප්‍රශ්න අංක **1** අනිවාර්ය වේ.
* **II කොටසින්** ප්‍රශ්න **හතරකට** ද, **III කොටසින්** ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

## I කොටස

**1. (අ)** (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

කිරිඳි ඔය, කැලණි ගඟ, පොම්පරිප්පු, සූකරතිත්ථ, පරාක්‍රම සමුද්‍රය, වික්ටෝරියා ජලාශය, දීඝවාපී, මිණිපේ අමුණ, මාතර, තිසා වැව, එළිෆන්ට්පාස්, පෙඩ්රික් කොටුව (ලකුණු 12 යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

මහා බ්‍රිතාන්‍යය, ජාවා දූපත, කළු මුහුද, ටෝකියෝ, කල්කටාව, ඉතාලිය (ලකුණු 06 යි)

**(ආ)** (i) පහත $A, B, C$ හා $D$ යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ශ්‍රී ලංකාව ද ඇතුළත් කොට ලෝක සිතියමක් නිර්මාණය කළ පුරාණ ග්‍රීක ජාතික භූගෝල විද්‍යාඥයා කවුරුන් ද?

*B* - ගල්පොත ශිලා ලිපිය කරවූ රජතුමාගේ නම සඳහන් කරන්න.

*C* - දුරකථනය නිපදවූ ඇමෙරිකානු ජාතිකයා කවුද?

*D* - නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිවරයාගේ නම ලියන්න. (ලකුණු 04 යි)


● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන චිත්‍රයේ දක්නට ලැබෙන උපකරණය කුමක් ද?

2. එය භාවිත කරන ලද්දේ කුමන කාර්යයක් සඳහා ද?

3. එය නිර්මාණය කරන ලද පුද්ගලයා කවුද?

4. ඔහු කුමන ජාතිකයෙක් ද?



*A*

(ලකුණු 04 යි)

[දෙවැනි පිටුව බලන්න.


(iii) 1. *B* රූපයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?

2. එතුමා ශ්‍රී ලංකාවට පැමිණීමට හේතු වූ, ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලැබුණු වාදය කුමක් ද?

3. මෙතුමාගේ මග පෙන්වීම යටතේ පිහිටුවා ගන්නා ලද සංවිධානය කුමක් ද?

4. මෙතුමාගේ මූලිකත්වයෙන් මෙරට ආරම්භ කරන ලද පාසලක නම ලියන්න.

(ලකුණු 04 යි)



*B*

## II කොටස

**2.** (i) ශ්‍රී ලංකාවට පැමිණ මෙරට පිළිබඳ තොරතුරු වාර්තා කළ විදේශිකයින් **තිදෙනෙකුගේ** නම් ලියන්න. (ලකුණු 03 යි)

(ii) ඉතිහාසය ගොඩනැගීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය භාවිත කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පුරාවස්තු විනාශ වීමට බලපාන මානව ක්‍රියාකාරකම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා වාසය කළ ගල්ලෙන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) පූර්ව ඓතිහාසික යුගයේ සුසාන භූමි හමු වූ ස්ථාන **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාවේ ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස, පූර්ව ඓතිහාසික යුගයෙන් වෙනස්වන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) අනුරාධපුර රාජධානි සමයේදී වියළි කලාපයේ ඉදිකරන ලද මහවැව් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) වියළි කලාපයේ මහවැව් ඉදිකිරීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) වැව් බැම්ම ඉදිකිරීමේදී භාවිත කළ තාක්ෂණය නිදසුන් **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) වැවක ප්‍රධාන අංග වන *A* - රළපනාව, *B* - සොරොව්ව, *C* - බිසෝකොටුව මගින් සිදුවන කාර්යයන් පිළිවෙළින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**5.** (i) මෙරට පැරණි සමාජ සංවිධාන ධූරාවලියේ ඉහළම ස්ථරයේ සිටි පාර්ශව **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) අතීතයේ අභ්‍යන්තර වෙළෙඳාම සම්බන්ධයෙන් පනවා තිබූ නීති **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) අතීත පාලකයින් පරිසරය ආරක්ෂා කරගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මෙරට පැරණි සමාජය තුළ කාන්තාවන්ට ගෞරවනීය තත්ත්වයක් හිමි වූ බව නිදසුන් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

[තුන්වැනි පිටුව බලන්න.

6. (i) මහනුවර රාජධානියේ අගනගරයට ස්වාභාවික ආරක්ෂාව ලැබුණු
(*a*) ගංගාව හා
(*b*) දුර්ග මාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) මහනුවර රාජධානිය පාලනය කළ නායක්කර් වංශික රජවරු **හතරදෙනා** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පළමුවන විමලධර්මසූරිය රජු මහනුවර රාජධානියේ නීත්‍යනුකූල අයිතිය තහවුරු කරගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මහනුවර රාජධානියේ අධිකරණ කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

7. (i) බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉංග්‍රීසි උගත් ශ්‍රී ලාංකිකයන්ට විවෘත වූ නව රැකියා අවස්ථා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) බ්‍රිතාන්‍ය පාලනයට පෙර මෙරට ජන සමාජය තුළ මුදල් භාවිතය සුලභ නොවීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) බ්‍රිතාන්‍ය පාලනය හේතුවෙන් මෙරට සමාජයෙහි ඇති වූ **අහිතකර** බලපෑම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) බ්‍රිතාන්‍ය පාලනය තුළින් මෙරටට ලැබුණු යහපත් ප්‍රතිඵල **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## III කොටස

8. (i) ඇමෙරිකා මහද්වීපයේ ජනපද පිහිටුවන ලද යුරෝපා රටවල් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) (*a*) ඇමෙරිකානු නිදහස් සටනට තේමා වූ සටන් පාඨය කුමක් ද?
(*b*) රුසියානු විප්ලවයට තේමා වූ සටන් පාඨය කුමක් ද? (ලකුණු 04 යි)

(iii) ඇමෙරිකානු නිදහස් සටනට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) රුසියානු විප්ලවයට බලපෑ හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

9. (i) බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය ආරම්භ වූ ප්‍රධාන කර්මාන්ත **තුන** ලියන්න. (ලකුණු 03 යි)

(ii) බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වූ කාර්මික විප්ලවය වෙනත් රටවල් කරා ව්‍යාප්ත වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලවයේ බලපෑම් නිසා ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව නිදසුන් **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස සමාජ ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්වීම් කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

* * *

OL/2023(2024)/33/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


33 S II

19550

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)


ඉතිහාසය II
வரலாறு II
History II

1. (අ) (i) විභාග අංකය ..............................




[අනෙක් පිටුව බලන්න

1. (අ) (ii)



සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 33 - ඉතිහාසය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

## 33 - ඉතිහාසය

I පත්‍රය - ලකුණු 1 x 40 = ලකුණු 40

---

II පත්‍රය -

**I කොටස**

ප්‍රශ්න අංක 1 (අනිවාර්ය ප්‍රශ්නයකි.)

| | | | | |
|---|---|---|---|---|
| (අ) කොටස | - | ලකුණු | 18 | ලකුණු 30 |
| (ආ) කොටස | - | ලකුණු | 12 | |

**II කොටස**

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රශ්න අංක 2 | - | ලකුණු | 18 | (ඕනෑම ප්‍රශ්න 4කට) 4 x 18 = ලකුණු 72 |
| ප්‍රශ්න අංක 3 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 4 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 5 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 6 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 7 | - | ලකුණු | 18 | |

**III කොටස**

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රශ්න අංක 8 | - | ලකුණු | 18 | (ඕනෑම ප්‍රශ්න 1කට) 1 x 18 = ලකුණු 18 |
| ප්‍රශ්න අංක 9 | - | ලකුණු | 18 | |

II පත්‍රය මුළු එකතුව: ලකුණු 12

### අවසාන ලකුණු ගණනය කිරීම

* සමස්ත පිළිතුරු පත්‍රයේ අවසන් ලකුණ මණ්ඩලය තුළ දී ගණනය කිරීම සිදු නොකෙරේ.

**ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කළ යුතු ආකාරය.**

I පත්‍රය මුළු ලකුණු ඉලක්කම් 2 කින් ඇතුළත් කළ යුතුය.

II පත්‍රය මුළු ලකුණු ඉලක්කම් 3 කින් ඇතුළත් කළ යුතුය.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................
............................................
............................................ √ △ 4/5

(ii) ............................................
............................................
............................................ √ △ 3/5

(iii) ............................................
............................................
............................................ √ △ 3/5

(03) එකතුව ➡ □ 10/15

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.
**VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

## I පත්‍රය - ඉගෙනුම් පල

- ඉතිහාසය 10 සහ 11 ශ්‍රේණිවලට අදාල විෂය නිර්දේශවල ඇතුලත් ඉගෙනුම් පල ආවරණය වන පරිදි ඓතිහාසික සිද්ධීන් හා සංකල්ප පිළිබඳ දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණ, සංස්ලේෂණ හැකියා පිරික්සීම

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
# க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2023 (2024)
## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

විෂය අංකය / பாட இலக்கம்: 33 | විෂය / பாடம்: ඉතිහාසය

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 4 | 31. | 3 |
| 02. | 1 | 12. | 3 | 22. | 4 | 32. | 1 |
| 03. | 4 | 13. | 2 | 23. | 2 | 33. | 4 |
| 04. | 1 | 14. | 4 | 24. | 1 | 34. | 1 |
| 05. | 2 | 15. | 3 | 25. | 3 | 35. | 3 |
| 06. | 1 | 16. | 3 | 26. | 3 | 36. | 3 |
| 07. | 2 | 17. | 2 | 27. | 2 | 37. | 3 |
| 08. | 4 | 18. | 1 | 28. | 1 | 38. | 1 |
| 09. | 3 | 19. | 2 | 29. | 1 | 39. | 3 |
| 10. | 1 | 20. | 4 | 30. | 3 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | |
|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை | 25 / 40 |
| I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25 / 40 |

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

## 33 - ඉතිහාසය

### II පත්‍රය

### I කොටස

**ප්‍රශ්න අංක 01**


**(අ)** (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

කිරිඳි ඔය, කැලණි ගඟ, පොම්පරිප්පු, සූකරතිත්ථ, පරාක්‍රම සමුද්‍රය, වික්ටෝරියා ජලාශය, දීඝවාපී, මිණිපේ අමුණ, මාතර, තිසා වැව, එළිෆන්ට්පාස්, පෙඩ්රික් කොටුව

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියමේ කොටසෙහි ලකුණු කර නම් කරන්න.


මහා බ්‍රිතාන්‍යය, ජාවා දූපත, කළු මුහුද, ටෝකියෝ, කල්කටාව, ඉතාලිය

(1). (අ) (i)


N
සූකරතිත්ථ
ෆෙඩ්‍රික් කොටුව
තිසාවැව
පොම්පරිප්පු
පරාක්‍රම සමුද්‍රය
මිනිපෙ අමුණ
දීඝවාපි
කැලණිගඟ
මාතර

(1). (අ) (ii)

1. (අ) (ii)



**(ආ)** (i) පහත $A, B, C$ හා $D$ යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ශ්‍රී ලංකාව ද ඇතුළත් කොට ලෝක සිතියමක් නිර්මාණය කළ පුරාණ ග්‍රීක ජාතික භූගෝල විද්‍යාඥයා කවුරුන් ද?

*B* - ගල්පොත ශිලා ලිපිය කරවූ රජතුමාගේ නම සඳහන් කරන්න.

*C* - දුරකථනය නිපදවූ ඇමෙරිකානු ජාතිකයා කවුද?

*D* - නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිවරයාගේ නම ලියන්න.

A. ක්ලෝඩියස් ටොලමි /ටොලමි

B. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල /නිශ්ශංකමල්ල

C. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් /ග්‍රැහැම්බෙල්

D. ඩී.එස්.සේනානායක **(ලකුණු 1x4 = 4 යි)**


- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන චිත්‍රයේ දක්නට ලැබෙන උපකරණය කුමක් ද?

2. එය භාවිත කරන ලද්දේ කුමන කාර්යයක් සඳහා ද?

3. එය නිර්මාණය කරන ලද පුද්ගලයා කවුද?

4. ඔහු කුමන ජාතිකයෙක් ද?



1. දුරේක්ෂය/ දුරදක්නය

2. අභ්‍යවකාශ නිරීක්ෂණය /දුර බැලීම /ආකාශ වස්තු නිරීක්ෂණය

3. ගැලීලියෝ ගැලීලි /ගැලීලි


4. ඉතාලි **(ලකුණු 1x4 = 4 යි)**

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?

2. එතුමා ශ්‍රී ලංකාවට පැමිණීමට හේතු වූ, ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලැබුණු වාදය කුමක් ද?

3. මෙතුමාගේ මග පෙන්වීම යටතේ පිහිටුවා ගන්නා ලද සංවිධානය කුමක් ද?

4. මෙතුමාගේ මූලිකත්වයෙන් මෙරට ආරම්භ කරන ලද පාසලක නම ලියන්න.



*B*

1. හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමා/ හෙන්රි ඕල්කොට් තුමා/ ඕල්කොට් තුමා

2. පානදුරාවාදය / පානදුරා

3. පරම විඥානාර්ථ සමාගම/ බෞද්ධ පරම විඥානාර්ථ සමාගම

4. කොළඹ ආනන්ද විද්‍යාලය/ මහනුවර ධර්මරාජ විද්‍යාලය/ගාල්ලේ මහින්ද විද්‍යාලය/ මාතලේ විජය විද්‍යාලය/ගම්පොළ ජිනරාජ විද්‍යාලය/ නාවලපිටියේ අනුරුද්ධ විද්‍යාලය

**(මින් එක පාසලක්)**

**(ලකුණු 1x4 = 4 යි)**

- විවිධ මත ඉවසීමට හුරු වීම
- පොත්පත් කියවීමට පෙළඹීම
- විචාරශීලී බුද්ධිය වර්ධනය වීම
- ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් සෙවීම
- පෞරුෂත්වය වර්ධනය වීම

***(මින් කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 3+3 = 06)***

**ඉගෙනුම් පලː**

*මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි.*

**ප්‍රශ්න අංක 03**

**(i) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා වාසය කළ ගල්ලෙන් තුනක් සඳහන් කරන්න.**

(i) පාහියන්ගල, කුරුවිට බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන, අත්තනගොඩ අළු ලෙන, සීගිරිය පොතාන, සීගිරිය අලිගල, පිදුරංගල, රාවණා ඇල්ල ලෙන

***(මින් තුනක් සඳහා ලකුණු 1×3= 03)***

**(ii) පූර්ව ඓතිහාසික යුගයේ සුසාන භූමි හමු වූ ස්ථාන හතරක් සඳහන් කරන්න.**

(ii) ඉබ්බන්කටුව, ගල්සොහොන් කනත්ත, යටිගල්පොත්ත, හල්දුම්මුල්ල, බෙරගල,රංචාමඩම, නිකවලමුල්ල, කලඹටුවාව, පොම්පරිප්පු, බණ්ඩත්තර, හබරත්තාව, හේවානිවල, දුම්මලසූරිය

***(මින් හතරක් සඳහා ලකුණු 1×4 = 04)***

**(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාවේ ලක්ෂණ දෙකක් විස්තර කරන්න.**

(iii)
- ස්ථිර වාසස්ථාන ඉදි කරගැනීම (ස්ථිරවාසිතාවය)
- කෘෂිකර්මාන්තය හා දඩයම් කිරීම
- යකඩ හා ගල් මෙවලම් භාවිත කිරීම
- සකපෝරුව භාවිතයෙන් මැටි බඳුන් තැනීම
- කාන්තාවන් රූපලාවන්‍ය කටයුතු කිරීම
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර අනුගමනය කිරීම

***(මින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 2 + 3= 05)***

**(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස, පූර්ව ඓතිහාසික යුගයෙන් වෙනස්වන ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

(iv) - වැවක් කේන්ද්‍ර කොට ජනාවාස ඇතිවීම (වාපිගාම)
- භූවිෂමතාව පදනම් කරගෙන ජනාවාස පැතිරීම
- ගංගාවේ පිටාර නිම්නයට බැහැරින් නිවාස ඉදිකිරීම
- වෘත්තීන් ආශ්‍රයෙන් ජනාවාස බිහිවීම
- කාර්යය පදනම් කරගත් ජනාවාස ඇතිවීම
- කුඩා, මධ්‍ය හා නාගරික ජනාවාස ඇතිවීම
- ජනාවාසවල සංවිධානය හා පරිපාලනය ක්‍රමවත්ව පැවතීම
- ජනාවාසවල ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම

***(මින් කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 3 + 3= 06)***

**ඉගෙනුම් පලඃ**

*ඓතිහාසික යුගයට අයත් විද්‍යාව හා තාක්ෂණික දැනුම විස්තර කරයි.*

## ප්‍රශ්න අංක 04

**(i) අනුරාධපුර රාජධානි සමයේදී වියළි කලාපයේ ඉදිකරන ලද මහවැව් තුනක් සඳහන් කරන්න.**

(i) මින්නේරිය වැව, කවුඩුල්ල වැව, පදවිය වැව, හුරුලු වැව, නාච්චදූව වැව, මහ කනදරා වැව, කලා වැව, මහවිලච්චිය වැව, ගිරිතලේ වැව, කන්තලේ වැව, යෝධ වැව, මහගල්කඩවල වැව, මානාකැටිය වැව

***(මින් තුනක් සඳහා ලකුණු 1×3 = 03)***

**(ii) වියළි කලාපයේ මහවැව් ඉදිකිරීමට හේතු දෙකක් සඳහන් කරන්න.**

(ii) - කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීම
- ගංවතුර පාලනය කිරීම
- නාගරික ජල අවශ්‍යතා සපුරා ගැනීම
- වැඩිවන ජනගහනයට සාපේක්ෂව ආහාර නිපදවීමට අවශ්‍ය ජලය ලබා ගැනීම
- නියං කාලවලදී ජල අවශ්‍යතා සපුරා ගැනීම
- වැසි ජලය සංරක්ෂණය කිරීම

***(මින් කරුණු දෙකක් සඳහා ලකුණු 2 ×2= 04)***

**(iii) වැව් බැම්ම ඉදිකිරීමේදී භාවිත කළ තාක්ෂණය නිදසුන් දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.**

(iii) - පිහිටි ගලක් ඇසුරෙන් වැව් බැම්ම නිර්මාණය කිරීම
- ස්වභාවික කඳු දෙකක් අතර වැව් බැම්ම ඉදිකිරීම
- කඳු රහිත ප්‍රදේශවල භූමියේ පිහිටීම අනුව වැව් බැම්ම ඉදිකිරීම
(උදාහරණ ඃ යෝධ වැව)

- වඩා දිගු දුරකින් වැව් බැම්ම නිර්මාණය කිරීම
- පස් තට්ටු කිහිපයක් එකිනෙක මත අතුරා තදින් තලා වැව් බැම්ම ඉදිකිරීම
- වැව් බැම්මේ ආරක්ෂාවට රළපනාව නිර්මාණය කිරීම
- පොළොවේ පාෂාණ සංයුතිය හා සමෝච්ඡ රේඛා විහිදීම සලකා බලා වැව් බැම්ම ඉදිකිරීම
- වැව් බැම්ම සැකසීමේදී පාදම වඩා පුළුල්ව ඉදිකිරීම

***(මින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 2 + 3= 05)***

**(iv) වැවක ප්‍රධාන අංග වන *A* - රළපනාව, *B* - සොරොව්ව, *C* - බිසෝකොටුව මගින් සිදුවන කාර්යයන් පිළිවෙළින් පැහැදිලි කරන්න.**

(iv) A - රළපනාව - වැව් බැම්ම ඛාදනය වීම වැළැක්වීම

B - සොරොව්ව - ප්‍රධාන ඇළට ජලය නිකුත් කිරීම හා රොන් මඩ ඉවත් කිරීම

C - බිසෝ කොටුව - වැවක ජල පීඩනය පාලනය කර ජලය මුදා හැරීම

***(ලකුණු 3 + 3=06)***

**ඉගෙනුම් පල:**

***ඓතිහාසික සමාජයෙන් උරුම වූ සමාජ දැක්ම හා පොදු භාවිත පිළිවෙත් විස්තර කරයි.***

## ප්‍රශ්න අංක 05

**(i) මෙරට පැරණි සමාජ සංවිධාන ධූරාවලියේ ඉහළම ස්ථරයේ සිටි පාර්ශව තුනක් සඳහන් කරන්න.**

(i) රජු, රාජකීය නිලධාරීන්, සංඝරත්නය, ගිහි ප්‍රභූන් (ධනවත් වෙළෙන්දන්, නාවුක කප්පිත්තන්, වෛද්‍යවරු, ගුරුවරු)

***(මින් තුනක් සඳහා ලකුණු 1×3 = 03)***

**(ii) අතීතයේ අභ්‍යන්තර වෙළෙඳාම සම්බන්ධයෙන් පනවා තිබූ නීති දෙකක් සඳහන් කරන්න.**

(ii)
- වෙළෙඳපළ සීමාවේ වෙළෙඳාම් කරන අයගෙන් පමණක් බදු අය කිරීම
- සියලු වෙළෙඳ ද්‍රව්‍ය නිලධාරීන්ට පෙන්වා අනුමත කර ගැනීම
- කිරුම් මිනුම් සඳහා ප්‍රමිති ගත තරාදි පඩි භාවිත කිරීම
- බුලත් පුවක් මණ්ඩපවල තබා වෙළෙඳාම් කළ යුතු වීම
- පොහොය දිනවල වෙළෙඳාම තහනම් වීම
- පෙරමගට ගොස් භාණ්ඩ මිලදී ගැනීම තහනම් වීම

***(මින් කරුණු දෙකක් සඳහා ලකුණු 2 ×2= 04)***

**(iii) අතීත පාලකයින් පරිසරය ආරක්ෂා කරගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න.**

(iii)
- උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බවට නීති පැනවීම
- ගස්කොළන් කැපීමේදී රජය පනවා ඇති නීති රීතිවලට අනුව කටයුතු කළ යුතු වීම (හේන් වගාව සඳහා)
- නිසි කලට සීසෑම කළ යුතු වීම
- ස්වභාවික පරිසරයේ ජීවත් වන සතුන් ආරක්ෂා කිරීමට නීති පැනවීම
- පරිසරයට හානි නොවන ලෙස අප ජලය හා මල අපද්‍රව්‍ය පිට කිරීමට නිසි ක්‍රමවේද සැකසීම

***(මින් කරුණු දෙකක් විස්තරයට ලකුණු 2 + 3= 05)***

**(iv) මෙරට පැරණි සමාජය තුළ කාන්තාවන්ට ගෞරවනීය තත්ත්වයක් හිමි වූ බව නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

(iv)
- රාජ්‍ය පාලනය සඳහා කාන්තාවන්ට අවස්ථාව හිමිවීම
- දැඩි සමාජ බැඳීම්වලින් තොරව කටයුතු කිරීමට හැකිවීම
- මවක් ලෙස ගෞරව ලැබීම
- සූප ශාස්ත්‍රයේ නිපුණ වීම හේතුවෙන් ගෞරව දැක්වීම
- ආගමික කටයුතු සඳහා නිදහස හිමිවීම
- සාමාන්‍ය සමාජයේ කාන්තාවන්ට නායකත්වය සඳහා අවස්ථාව ලැබීම

***(මින් කරුණු තුනක් විස්තරයට ලකුණු 3 + 3= 06)***

**ඉගෙනුම් පල:**

*ශ්‍රී ලාංකික රජවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය අගයමින් පැරණි නීති සම්ප්‍රදායන් පිළිබඳ අවබෝධ කර ගනියි.*

## ප්‍රශ්න අංක 06

**(i) මහනුවර රාජධානියේ අගනගරයට ස්වාභාවික ආරක්ෂාව ලැබුණු**

**(*a*) ගංගාව හා**

**(*b*) දුර්ග මාර්ග දෙකක් සඳහන් කරන්න.**

(i) (a) මහවැලි ගඟ

(b) බලන, හුන්නස්ගිරිය, ගලගෙදර, නාලන්ද (බලකඩුව), ගිනිගත්හේන

***(ලකුණු 1×3 = 03යි)***

**(ii)** **මහනුවර රාජධානිය පාලනය කළ නායක්කර් වංශික රජවරු හතරදෙනා සඳහන් කරන්න.**

(ii) ශ්‍රී විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ, රාජාධිරාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ

*(ලකුණු 1×4 = 04යි)*

**(iii)** **පළමුවන විමලධර්මසූරිය රජු මහනුවර රාජධානියේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න.**

(iii)
- කුසුමාසන දේවිය විවාහ කර ගැනීම
- බුදු දහම වැළඳ ගැනීම
- විමලධර්මසූරිය යන බෞද්ධ නම ලබාගැනීම
- දන්ත ධාතුව මහනුවරට වැඩම කරවා ගැනීම

*(මින් කරුණු දෙකක් විස්තරයට ලකුණු 2 + 3= 05)*

**(iv)** **මහනුවර රාජධානියේ අධිකරණ කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

(iv)
- ඉහළම අධිකරණය රජු වීම
- සෑම නිලධාරියකුටම තම පදවිය අනුව අධිකරණ බලතල හිමිවීම
- රජතුමා විසින්ම විසඳිය යුතු නඩු වර්ග පැවතීම
- මරණීය දණ්ඩනය පැනවීමේ බලය රජු සතුවීම
- විවිධ දඬුවම් ක්‍රම පැවතීම

*(මින් කරුණු තුනක් විස්තරයට ලකුණු 3 + 3= 06)*

**ඉගෙනුම් පල:**

*ආගන්තුක සංස්කෘතික ධාරා දේශීය සමාජ ව්‍යුහයට අනුකලනය වූ ආකාරය විග්‍රහ කරයි.*

## ප්‍රශ්න අංක 07

**(i)** **බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉංග්‍රීසි උගත් ශ්‍රී ලාංකිකයන්ට විවෘත වූ නව රැකියා අවස්ථා තුනක් සඳහන් කරන්න.**

(i) නීතිඥ, වෛද්‍ය, ඉංජිනේරු, මිනින්දෝරු, ලිපිකාර සේවය, සිවිල් සේවය,

*(මින් තුනක් සඳහා ලකුණු 1×3 = 03)*

**(ii)** **බ්‍රිතාන්‍ය පාලනයට පෙර මෙරට ජන සමාජය තුළ මුදල් භාවිතය සුලභ නොවීමට හේතු දෙකක් ලියන්න.**

(ii)
- ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් පැවතීම
- භාණ්ඩ හුවමාරු ක්‍රමයක් පැවතීම
- අන්‍යොන්‍ය සහයෝගය හා සහජීවන ක්‍රමයක් පැවතීම
- වැටුපට වැඩ කරන ක්‍රමයක් නොතිබීම
- අත්තම් ක්‍රමය පැවතීම

- ගම් සභා ක්‍රමය මගින් පොදු වැඩ සිදු කිරීම
- ඉඩම් භුක්ති ක්‍රමය හා රාජකාරි ක්‍රමය ක්‍රියාත්මක වීම

*(මින් කරුණු දෙකක් සඳහා ලකුණු 2 × 2 = 04)*

**(iii) බ්‍රිතාන්‍ය පාලනය හේතුවෙන් මෙරට සමාජයෙහි ඇති වූ අහිතකර බලපෑම් දෙකක් විස්තර කරන්න.**

(iii)
- ඉතා දීර්ඝ කාලයක් විදේශ රාජ්‍යයක සූරා කෑමට ලක්වීම
- දේශීය ධනවතුන් සුළු පිරිසක් බිහි වුවද අති බහුතර ජනතාව දුප්පතුන් වීම
- ආදායම් බෙදී යාමේ ප්‍රබල විෂමතාව
- බටහිර සංස්කෘතිය පැතිරීම
- දේශීය සංස්කෘතිය පිරිහීම
- මධ්‍යසාර භාවිතය පැතිරීම
- ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම
- දේශීය දැනුම අභාවයට යාම
- ගම් සභාව වැනි ප්‍රයෝජනවත් ආයතන විනාශ වීම

*(මින් කරුණු දෙකක් විස්තරයට ලකුණු 2 + 3 = 05)*

**(iv) බ්‍රිතාන්‍ය පාලනය තුළින් මෙරටට ලැබුණු යහපත් ප්‍රතිඵල තුනක් පැහැදිලි කරන්න.**

(iv)
- ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි දැනුම රට තුළ පැතිරීම
- ගමනාගමන හා සන්නිවේදන කටයුතු දියුණු වීම
- අපනයන වැවිලි බෝග හඳුන්වාදීම
- කාර්මික විප්ලවයේ තාක්ෂණික දියුණුව මෙරටට ලැබීම
- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ස්ථාපිත වීම
- බටහිර අධ්‍යාපන අවස්ථා උදාවීම
- විවිධ රැකියා ක්ෂේත්‍ර බිහිවීම

*(මින් කරුණු තුනක් විස්තරයට ලකුණු 3 + 3 = 06)*

## III කොටස

**ඉගෙනුම් පල:**

*ඓතිහාසික ගෝලීය දේශපාලන ප්‍රවනතාවල ආදර්ශ විස්තර කරයි.*

## ප්‍රශ්න අංක 08

**(i) ඇමෙරිකා මහද්වීපයේ ජනපද පිහිටුවන ලද යුරෝපා රටවල් තුනක් සඳහන් කරන්න.**

(i) පෘතුගාලය, ස්පාඤ්ඤය, ඕලන්දය, ප්‍රංශය, බ්‍රිතාන්‍යය

*(මින් තුනක් සඳහා ලකුණු 1×3 = 03)*

**(ii) (a) ඇමෙරිකානු නිදහස් සටනට තේමා වූ සටන් පාඨය කුමක් ද?**

**(b) රුසියානු විප්ලවයට තේමා වූ සටන් පාඨය කුමක් ද?**

(ii) (a) නියෝජිතයන් නැත්නම් බදුත් නැත

(b) සාමය, ඉඩම්, ආහාර

*(ලකුණු 2×2 = 04යි)*

**(iii) ඇමෙරිකානු නිදහස් සටනට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න.**

(iii)
- ඇමරිකානු ජනපදවාසීන් කාලයක් තිස්සේ බ්‍රිතාන්‍යය මැදිහත්වීම අවම වූ පාලන ක්‍රමයකට හුරුවී සිටීම
- බ්‍රිතාන්‍යය අනුගමනය කළ තම රටට වාසිදායක ආර්ථික ප්‍රතිපත්තිය
- ජනපදවාසීන්ගේ සිතුම් පැතුම් ආකල්ප බ්‍රිතාන්‍ය පාලකයින් අවබෝධ කරගෙන නොසිටීම
- බ්‍රිතාන්‍යය විසින් අසාධාරණ ලෙස අණ පනත් හා නව බදු වර්ග පැනවීම
- ජනපදවාසීන්ගේ සාධාරණ සටන් මර්දනය කිරීම
- නිදහස පිළිබඳ ජනපදවාසීන් තුළ වූ උනන්දුව

*(මින් කරුණු දෙකක් විස්තරයට ලකුණු 2 + 3= 05)*

**(iv) රුසියානු විප්ලවයට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න.**

(iv)
- දූෂිත ඒකාධිපති රාජාණ්ඩු ක්‍රමය
- අධික බදු බර
- ප්‍රවේණිදාසයන් වූ සාමාන්‍ය ජනතාව ලද පීඩනය
- කම්කරුවන් ලද පීඩනය
- රුසියානු ගොවීන් හා කම්කරුවන් යුද සේවයට යොදා ගැනීම
- රට පුරා උග්‍ර ආහාර හිඟය හා භාණ්ඩවල මිල ඉහළ යාම
- ඉඩම් අයිතිය රදලවරුන් සතුවීම
- පල්ලියේ ආධිපත්‍යය
- පළමුවන ලෝක යුද්ධයට රුසියාවට සම්බන්ධ වීම නිසා රට තුළ උද්ගත වූ අර්බුද

*(මින් කරුණු තුනක් විස්තරයට ලකුණු 3 + 3= 06)*

ඉගෙනුම් පලः

*කාර්මික විප්ලවය හා එහි බලපෑම විග්‍රහ කරයි.*

## ප්‍රශ්න අංක 09

**(i) බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය ආරම්භ වූ ප්‍රධාන කර්මාන්ත තුන ලියන්න.**

(i) පේෂ කර්මාන්තය,. යකඩ හා වානේ කර්මාන්තය, ගල් අඟුරු කර්මාන්තය

*(ලකුණු 1×3 = 03යි)*

**(ii) බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වූ කාර්මික විප්ලවය වෙනත් රටවල් කරා ව්‍යාප්ත වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.**

(ii)
- ලොව පුරා සීඝ්‍රයෙන් ජනගහනය වර්ධනය වීම හා භාණ්ඩවලට තිබූ ඉල්ලුම ඉහළ යාම
- යුරෝපය තුළ ගමනාගමන හා ප්‍රවාහන කටයුතු වර්ධනය වීම
- ප්‍රංශය හා ජර්මනිය ගල් අඟුරු සොයා ගැනීම

*(මින් කරුණු දෙකක් සඳහා ලකුණු 2 × 2= 04)*

**(iii) කාර්මික විප්ලවයේ බලපෑම් නිසා ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව නිදසුන් දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.**

(iii)
- මැකඩම් ක්‍රමය හඳුන්වා දීම
- වාෂ්ප බලයෙන් ක්‍රියා කරන දුම්රිය එන්ජිම නිපදවීම
- නාවුක හා ජල ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව
  උදාහරණ: දුම්බෝට්ටුව හා දුම් නැව
- ඩෙම්ලර් විසින් මෝටර් රථය නිපදවීම
- රයිට් සහෝදරයන් විසින් ගුවන් යානය නිපදවීම

*(මින් කරුණු දෙකක් විස්තරයට ලකුණු 2 + 3= 05)*

**(iv) කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස සමාජ ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්වීම් කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

(iv)
- යහපත් මෙන්ම අයහපත් බලපෑම් ඇතිවීම
- සීඝ්‍ර නාගරීකරණය
- නාගරික ජනතාවගේ මූලික පහසුකම් අවම වීම
- වැඩ කරන ජනතාවගේ භෞතික ජීවන තත්ත්වය අසතුටු දායක වීම
- මුඩුක්කු හා පේළි නිවාස ඇතිවීම
- සමාජයේ ඇති නැති පරතරය වැඩිවීම
- පන්ති සහිත සමාජයක් බිහිවීම
- සමාජයේ විවිධ අපචාර වර්ධනය වීම
- ශ්‍රමය සූරා කෑමට ලක්වීම
- නව රැකියා අවස්ථා බිහිවීම
- ජනතාවට දැරිය හැකි මිලකට භාණ්ඩ ලබා ගැනීමට හැකිවීම
- වෘත්තීය සංගම් බිහිවීම
- සමාජ සුභසාධන කටයුතු සඳහා රාජ්‍ය අවධානය යොමුවීම
- පරිසර දූෂණය වැඩිවීම

*(මින් කරුණු තුනක් විස්තරයට ලකුණු 3 + 3= 06)*

******